**ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය - 2025**

--------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමයේ ("සංගමය") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුවල සාරාංශයද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21(අ) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සුළු පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ පිළිබිඹු වන පරිදි පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සංගමයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2025 මැයි 21 දිනැති අංක 24/2437 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග | | | |
| | V කොටසේ 14 (xix)වගන්තිය | එක් එක් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් අදාළ ක්‍රීඩාවේ නිරත අනුබද්ධ ආයතන, ක්‍රීඩා සමාජ සහ වෙනත් සංවිධාන ලියාපදිංචි කිරීමත්, එම ආයතන, සමාජ සහ සංවිධාන වෙත ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමත් සිදු කළ යුතුවේ. කෙසේ වෙතත්, සංගමය විසින් තම අනුබද්ධ ආයතන සහ ක්‍රීඩා සමාජ වෙත එම ලියාපදිංචි සහතික නිකුත් කර නොතිබුණි. | අදාළ වාර්තා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යවා ලියාපදිංචි සහතික නිකුත් කිරීමට පියවර ගනු ලැබේ. | ලියාපදිංචි අනුබද්ධ සංගම් සම්බන්ධයෙන් වාර්තාවක් පවත්වා, සහතිකය නිකුත් කළ යුතුය. |
| (ආ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 නොවැම්බර් 02 දිනැති අංක 02/2023 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 3.13 වගන්තිය | සංගමය යාවත්කාලීන කරන ලද සාමාජික ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සාමාජික ලේඛනය සකස් කර ප්‍රමාදයකින් තොරව විගණනයට ඉදිරිපත් කරමි. | සාමාජික ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 දෙසැම්බර් 15 දිනැති ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන වල ක්‍රියාකාරකම් සඳහා වන මාර්ගෝපදේශයේ 3(xiv) වගන්තිය. | සංගමය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණු අතර, ඒ පිළිබඳ වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2026 වසරේ සිට විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,577,073 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.73,811ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,650,884ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂය තුලදී ජාත්‍යන්තර අශ්වාරෝහක සම්මේලනයෙන් ලද රු.3,791,000 ක ප්‍රදානය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලොචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කර නොතිබු අතර, සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමනිසා, සමාලෝචිත වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කරගෙන තිබේද නැද්ද යන්න පිළිබඳව ඇගයීමක් සිදු කිරීමට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ සිදු කරන ලද කාර්යයන් පිළිබඳ ප්‍රගති වාර්තාවක් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තා සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | "දිට්වා" ආපදා තත්ත්වය සඳහා මූල්‍ය ආධාර ලෙස ජාත්‍යන්තර අශ්වාරෝහක සම්මේලනයෙන් රු.3,791,000 ක පරිත්‍යාගයක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, එම අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා යොදවා නොතිබූ අතර, 2026 අප්‍රේල් මස අවසානය දක්වා සංගමයේ ජංගම ගිණුමක අක්‍රියව පැවතුණි. | යෝජිත ක්‍රීඩා සංවර්ධන වැඩසටහනකට වියදම් කිරීමේ අපේක්ෂාවෙන්, ඉතිරි මුදල් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර ඇත. | ලැබෙන මුදල් අපේක්ෂිත අරමුණු සඳහා යෙදවීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා අශ්වාරෝහක ක්‍රීඩා සංගමයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාව පුරා අශ්වාරෝහක ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීමයි. කෙසේ වෙතත්, සංගමය විසින් 2025 පෙබරවාරි මාසයේදී රු.2,850,000 ක වටිනාකමකින් යුත් තම අශ්වයන් දෙදෙනා විකුණා තිබුණු අතර, එම අලෙවියෙන් ලද ආදායම හිඟ වගකීම් පියවීමට යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අරමුණු සාර්ථකව ළඟා කර ගැනීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩපණ වී තිබුණි. | අදාළ ක්‍රීඩකයින්, ක්‍රීඩා සමාජ සහ අශ්ව ක්‍රීඩාව පුහුණු කිරීමේ ආයතන විසින් අශ්වයන් රඳවා තබා ගැනීම, නඩත්තු කිරීම සහ පුහුණු කටයුතු සිදු කිරීම කළ යුතුය. | සංගමයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විධායක කමිටුව අවධානය යොමු කළ යුතුය. |